කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

මානවශාස්ත්‍ර පීඨය

# බෞද්ධ දර්ශනය

## මහායාන දර්ශනය, තර්ක ශාස්ත්‍රය හා බෞද්ධ ඥානමීමාංසාව BUPH – E 3015

එක් කොටසකින් යටත් පිරිසෙන් ප්‍රශ්න දෙකක්වත් (02) ඇතුලත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

### I කොටස

01. මහායාන බුදුසමයෙහි උදාව කෙරෙහි බලපෑ විවිධ සාධක අදාල මූලාශ්‍රය නයින් විමසන්න.

02. මහායාන මධ්‍යමක නිකායේ මූලික ඉගැන්වීම් කෙරෙහි ආදි බුදුසමයෙහි බලපෑම ප්‍රමාණ කරන්න.

03. බාහිර ලෝකයේ පැවැත්ම පිළිබඳ යෝගාචාරීන්ගේ මතය චිත්තමාත්‍රතා සිද්ධාන්තය ඇසුරින් ගෙනහැර දක්වන්න.

04. මෙරට තාන්ත්‍රික බුදුසමයෙහි බලපෑම අද්‍යයතන ශ්‍රී ලාංකේය බෞද්ධ පුදපූජා සහ වත්පිළිවෙත් ඇසුරින් විමසන්න.

05. බුද්ධ සංකල්පයෙහි සුවිශේෂතා ථෙරවාද මෙන්ම මහායාන මූලාශ්‍රය පදනම් කොටගෙන ඉදිරිපත් කරන්න.

### II කොටස

06. ඉන්ද්‍රිය සංජානන ක්‍රියාවලියෙහි මනෝවිද්‍යාත්මක පදනම මධුපිණ්ඩික සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න.

07. තක්කී වීමංසී සම්ප්‍රදාය ප්‍රාමාණික ඥාන මාර්ගයක් වශයෙන් නොසැළකීමේ යුක්ති යුක්තතාව මුල් බුදුසමයාගත ඉගැන්වීම් ඇසුරෙන් ප්‍රකට කරන්න.

08. සත්‍යයට සමීපවීම පිණිස ද්විකෝටික තර්කනයට වඩා චතුශ්කෝටික තර්කනය යෝග්‍යවීමේ හේතු බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් තහවුරු කරන්න.

09. ස්වාර්ථානුමානය සහ පරාර්ථානුමානය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකකට පමණක් ප්‍රමාණවත් සටහන් ලියන්න.

    1. ආර්ය නාගාර්ජුන පාදයෝ
    2. මූලමාධ්‍යමික කරිකා
    3. ආර්ය වසුබන්ධු පාදයෝ
    4. විඥප්තිමාත්‍රතාසිද්ධිවිංශතිකා කාරිකා

*************************